**හොරණ නගර සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**

**--------------------**

**1.** මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**---------------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 30දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 23 දින ද සභාපතිවරයාට යවා ඇත**.**

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට හොරණ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

| | විගණන නිර්දේශය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂයන්ට අදාලව සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ රු.8,060,134ක් වූ වැටුප් ප්‍රතිපූර්ණ සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | අඩුපාඩුව පිළිගතිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයට අදාල සභික දීමනා රු.1,710,000 වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.1,515,000 ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | අඩුපාඩුව නිවැරදි කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ සුභසාධක සේවා වැඩසටහනට අදාල ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු වියදම රු.462,139 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.1,039,348 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | පිළිගතිමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | 2018 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත මුදල් පොතේ ශේෂය රු.48,258 ක් වැඩියෙන් හා සේවක ණය , මුදල් පොතෙහි ශේෂය රු.23,566 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරන බව දන්වමි. |
| (v) | සමාලෝචිත වර්ෂයේ ණය පදනම යටතේ මිලදී ගත් රු.246,000 ක් වටිනා ලී බඩු උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (vi) | සමාලෝචිත වර්ෂයට අදාලව ව්‍යාපෘති වියදම් හා ණයහිමි වටිනාකම රු.536,065 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (vii) | සමාලෝචිත වර්ෂය අවසානයට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ට ගෙවිය යුතු මුදල රු.207,237 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.53,401 ක් ලෙස දැක්වීම හේතුවෙන් විවිධ ණයහිමි වටිනාකම රු.153,836 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (viii) | සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.36,000 වටිනා ප්‍රින්ටරය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (ix) | තොග වටිනාකම ලෙස භෞතික තොගය ගිණුම්ගත කිරීම වෙනුවට රු.2,421,971 වු පොත් අගය ගිණුම් ගතකර තිබුණි. | තොග වටිනාකම ලෙස භෞතික තොග වටිනාකම ගිණුම්ගත කල යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.93,652,478 ක් වූ ගිණුම් විෂයයන් 08 කට අදාළ ශේෂයන් ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.95,473,837ක වෙනසක් නිරීක්ෂණය විය. | අදාල ශේෂ වල වෙනස් කම් සසඳා ගිණුම් නිවැරදි කිරිමට කටයුතු කල යුතුවේ. | වෙනස්කම්වලට අදාල දත්ත සොයා ගැනීමට ලේඛනාගාරයේ තොරතුරු නොමැත. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| යාවත්කාලීන කරන ලද වරිපනම් ලේඛනය , අත්තිකාරම් ලේඛනය හා උපලේඛන නොමැතිවීම නිසා එකතුව රු.6,612,315 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | වරිපනම් ලේඛන යාවත්කාලීන කල යුතු අතර අත්තිකාරම් ශේෂයට අදාල නිවැරදි උපලේඛන ඉදිරිපත් කල යුතුවේ. | අත්තිකාරම් සඳහා උපලේඛන සකස් කිරිමට තොරතුරු නොමැති බවත් , පරිගණක පද්ධතියේ ඇති දෝෂයන් හේතුවෙන් වරිපනම් ලේඛන යාවත්කාලීන කිරිමට නොහැකි වූ බව දන්වමි. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | 1988 නගර සභා ආඥා පනත 170 අ (2) වගන්තිය | 6,320,391 | සභාවට අයවිය යුතු සියළුම ආදායම් සහ දඩ මුදල් අයකර ගෙන නගර සභා අරමුදලට බැර කර නොතිබුණි. | නගර සභා ආඥා පනත අනුව කටයුතු කල යුතුවේ. | හිග මුදල් අය කිරිමට කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | | |
| මුදල් රෙගුලාසි 571 | 1,186,209 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| (ඇ) 2008 ජනවාරි 25 දිනැති අංක1533/16 දරන ගැසට් පත්‍රය | | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදිය යුතු ස්ථාන 07 ක් සඳහා ආරක්ෂණ බලපත්‍ර ලබා දී නොතිබුණි. | ගැසට් පත්‍රය අනුව කටයුතු කල යුතුවේ. | බලපත්‍ර ලබා දීමට ඉදිරි කටයුතු කරමි. |
| (ඈ) 2017 දෙසැම්බර් 29 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය | 756,950 | ප්‍රචාරක දැන්වීම් පුවරු 131 කින් ගාස්තු අයකර ගෙන නොතිබුණි. | ගැසට් පත්‍රය අනුව කටයුතු කල යුතුවේ. | හිඟ මුදල් අයකර ගැනිමට නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කර ඇත. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.38,105,742 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.27,311,671 ක් විය.

2.2 මූල්‍ය පාලනය
----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නාගරික සංවර්ධන අධිකාරි ජංගම ගිණුමේ 2009 වර්ෂයේ සිට පැවත එන රු.99,885 ක ශේෂයක් නිශ්කාර්යයව පවතින අතර මෙම මුදල් ඵලදායි කාර්යයට යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල මුදල් ඵලදායි කාර්යයකට යොදාගත යුතුවේ. | මෙම මුදල යොදාගෙන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරිමට සකච්ජා වෙමින් පවති. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 15,800,000 | 15,638,334 | 13,517,038 | 4,836,766 | 15,750,000 | 15,527,405 | 15,219,338 | 2,884,000 |
| (ii) | කුලී | 8,952,100 | 8,494,064 | 6,382,925 | 2,597,165 | 8,815,072 | 8,910,082 | 6,874,275 | 2,717,003 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,931,500 | 1,941,300 | 1,585,700 | 383,100 | 2,200,000 | 2,014,260 | 1,996,260 | 30,500 |
| (iv) | වෙනත් ආදායම් | 25,842,000 | 10,873,887 | 553,719 | 10,320,168 | 760,000 | 1,012,889 | 748,486 | 264,403 |

### 2.3.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) සමාලෝචිත වර්ෂය ආරම්භයට වරිපනම් හිඟ ශේෂය රු.2,872,864 ක් වූ අතර වර්ෂය අවසානයේදී ඉන් රු.1,679,381 ක් හෙවත් සියයට 58 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ වරිපනම් ආදායම කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ වරිපනම් ආදායම රැස් කිරිමට කටයුතු කරමි. |
| (ii) වාර්ෂික බිල් කිරිම රු.14,842,534 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු.12,683,201 ක් හෙවත් සියයට 85 ක් අයකර ගෙන තිබුණි. වර්ෂය අවසානයට වරිපනම් හිඟය වූ රු.4,112,277 කින් රු.1,377,203 ක් 2019 මැයි 28 දින වන විට අයකර ගෙන තිබූ අතර තව දුරටත් හිඟය රු.2,735,074 ක් විය. | හිඟ වරිපනම් ආදායම කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ වරිපනම් ආදායම රැස් කිරිමට කටයුතු කරමි. |
| (iii) හිඟ වරිපනම් බදු සඳහා කාල විශ්ලේෂණයක් ලබා දී නොතිබුණි. | හිඟ වරිපනම් බදු කාල විශ්ලේෂණය පිළියෙල කලයුතු වේ. | භාවිතා කරනු ලබන පරිඝණක මෘදුකාංග පද්ධතිය මගින් කාල විශ්ලේෂණයක් ලබා ගැනීම අපහසු බවත්, ඉදිරියේදි කාල විශ්ලේෂණයක් ලබාදීමට කටයුතු කරමි. |

2.3.3 කඩ කුලී

-----------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ කඩ කුලිය රු.2,823,269 ක් වූ අතර වර්ෂය තුලදී එම හිඟ කුලියෙන් රු.432,865 ක මුදලක් කපා හැර තිබුණු අතර , තව දුරටත් හිඟ රු.484,385 ක් විය. | හිඟ ආදායම අයකර ගත යුතුවේ. | මෙම හිඟයෙන් රු.179,599 ක අය නොවන ශේෂය ලේඛනවලින් කපා හැරීමට කටයුතු ආරම්භ කර ඇති බවත්,ඉතිරි හිඟය වන රු.304,785 ක මුදල අය කර ගැනීමට නීතිමය පියවර ගනිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ බිල් කල ආදායම රු.8,916,493 ක් වූ අතර 2018 මැයි 31 දින වන විට ඉන් රු.1,277,963 ක මුදලක් අයවිය යුතුව තිබුණි. | හිඟ ආදායම අයකර ගත යුතුවේ. | හිඟ ආදායම රැස් කිරිමට කටයුතු කරමි. |

(ඇ) මුද්දර ගාස්තු

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂයට අදාල මුද්දර ගාස්තු ලැබී නොතිබුණ අතර , 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.10,000,000 ක් විය. | මුද්දර ගාස්තු ලබා ගැනිමට කටයුතු කල යුතුවේ. | මුද්දර ගාස්තු ගෙන්වා ගැනීම සඳහා උප ලේඛන සකස් කර ඉදිරිපත් කර ඇත. |

3 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්ය සාධනය

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අතුරු ව්‍යවස්ථා<br>------------------<br>නගර සභා පනතේ 157 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 15 ක් ඉටු කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබු නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 04 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි. | නගර සභා පනත අනුව අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතුවේ. | කාරණා 14 ක් සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ඇත. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

---------------------

| | | |
|---|---|---|
| (i) සභාව විසින් 2018 වර්ෂය තුල අයවැය ලේඛනය මගින් රු.මි.208.24 ක ප්‍රතිපාදනයක් වෙන් කර දී අංශ 10 ක් යටතේ ක්‍රියාකාරකම් 260 ක් ක්‍රියාත්මක කිරිමට වගකිව යුතු නිලධාරින් හා අධීක්ෂණ නිලධාරින් පත්කර තිබුණ ද එම ක්‍රියාකාරකම් වල ප්‍රගතිය මැන බැලීමේ ක්‍රමවේදයක් සභාව සතුව නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | ඉදිරියේදි නිවැරදිව කටයුතු සිදු කරමි. |
| (ii) සභාව විසින් 2018 වර්ෂය තුල පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය වෙනුවෙන් රු.මි.208.24 ක අයවැය ඇස්තමේන්තු සකස් කළද ක්‍රියාකාරි සැලැස්ම තුළ රු.මි.21.83 ක ප්‍රතිපාදන පමණක් ඇතුලත් කර තිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සමඟ අක් මුදල් සැලැස්මක් පිලියෙල කල යුතු වේ. | එක් එක් අංශයට අදාලව ප්‍රමුඛතාවය අනුව වැඩ සටහන් ක්‍රියාකාරකම් හා වෙන් කරනු ලබන ප්‍රතිපාදන අනුව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම පිලියෙල කරයි. |
| (iii) සභා කර්මාන්ත සඳහා වෙන් කළ රු.මි.4.4 ක ප්‍රතිපාදන ඉක්මවා ව්‍යාපෘති 41 ක් වෙනුවෙන් රු.මි.23.48 ක ඇස්තමේන්තු සකස්කර අනුමැතියකින් තොරව රු.මි.19.08 ක ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි. | වාර්ෂික අයවැය ලේඛනයේ වෙන් කළ ප්‍රතිපාදන පදනම්කර ව්‍යාපෘති සැලසුම් ක්‍රියාත්මක කලයුතුවේ. | සභිකයින්ගෙන් සැදුම් ලත් මහා සභාවක් මගින් 2018 වර්ෂයේ මුල් වකවානුව පාලන කටයුතු බාර ගැනිම හා ඔවුන්ගේ ප්‍රතිපත්ති තීරණ මත ක්‍රියා කිරිමට සිදු විය. |

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

| | | |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ එක් රැස්වන නොදිරන කුණු කසළ බැහැර කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් නොමැතිවීම හා එම කාර්යය බාහිර පාර්ශවයක් ලවා සිදු කිරීම නිසා 2018 වර්ෂය වෙනුවෙන් රු.31,250,113 ක් වන විශාල වියදමක් සභාව විසින් දරා තිබු අතර කසළ බදු වලින් ලැබු ආදායම රු.1,520,011 ක් පමණක් විය. | කසල බැහැර කිරිමේදී දරන පිරිවැය අවම කර ගත යුතු වේ. | කසල කළමනාකරණ කටයුතු ක්‍රමවත් වැඩ පිලිවෙලක් යටතේ සිදු කරමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

| | | |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ලඟා කර ගැනිමට දිගු | දිළිඳුකම පිටු දැකීමට පවුල් 04 කට සහන පදනම මත කිරි/කැඳ හල් ලබාදීම හා |

| | | |
|---|---|---|
| දැනුවත්ව සිටියද එකී අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා නව ගෝලීය දර්ශක තුලින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය හා සෞඛ්‍ය නංවාලිම සඳහා වන දිගු කාලීන සැලසුම් 2018 දෙසැම්බර් 31 දින වන විටත් සකස් කර නොතිබුණි. | කාලීන සැලසුම් සකස් කල යුතුවේ. | බෝනොවන රෝග පාලනයට කායවර්ධන මධ්‍යස්ථාන 02 ක් පිහිටුවා ඇත. |

3.2 මානව සම්පත් කළමනාකරණය
-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ලේකම් තනතුරේ වැඩ ආවරණය කිරිමට කළමනාකරණ සහකාර අධි ශ්‍රේණියේ නිලධාරියෙකු පත් කර තිබුණි. | කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනිමට කටයුතු කල යුතුවේ. | පුරප්පාඩු පිරවීමට කටයුතු කරමි. |
| (ආ) 2019 මැයි 31 දින වන විට සභාවේ තෘතීය මට්ටමේ එක් තනතුරක පුරප්පාඩුක් තිබුණි. | කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනිමට කටයුතු කල යුතුවේ. | පුරප්පාඩු පිරවීමට කටයුතු කරමි. |
| (ඇ) සභාවේ පුස්තකාලයාධිපති,ආදායම් පරික්ෂක, දත්ත ක්රියාකරු, පෙර පාසැල් ගුරු , ක්‍රීඩාංගන භාරකරු , සෞඛ්‍ය පරීක්ෂක යන තනතුරුවල එක් අයෙකු බැගින් හා ගිනි හට තනතුරු 03 ක්, පුරප්පාඩුව පැවතුණ අතර ප්‍රාථමික මට්ටමේ තනතුරු 14 ක පුරප්පාඩු පැවතුණි. | කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනිමට කටයුතු කල යුතුවේ. | පුරප්පාඩු පිරවීමට කටයුතු කරමි. |

## 3.3 ප්‍රසම්පාදනය

### 3.3.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වාර්ෂික අයවැය ලේඛනය මගින් ප්‍රග්ධන වියදම් යටතේ රු.මි.27.65 ක ප්‍රතිපාදන ඇතුළත් කර තිබුණද , ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමේදී රු.මි.2.55 ක පිරිවැයක් වූ වැඩ සටහන් 04 ක් ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර තිබුණි. | අයවැය ලේඛනයේ සඳහන් ප්‍රාග්ධන වැය ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කල යුතුවේ. | ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර ඇත. |

## 4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

### 4.1 නොවිසඳී ඇති විගණන නිරීක්‍ෂණ

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ළමා ක්‍රීඩාංගනයේ කොටසක බාහිර පාර්ශවයක් විසින් අනවසරයෙන් වෙළඳ සැලක් පවත්වාගෙන යමින් තිබූ අතර, එය ඉවත් කිරිම සඳහා සභාව අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | අනවසර පදිංචි කරුවන් ඉවත් කල යුතුවේ. | අනවසර ඉදි කිරිම කඩා ඉවත් කිරිමට කටයුතු කරමි. |
| (ආ) | වැවල පෙර පාසැල පිහිටි සභාවට අයත් ඉඩමෙන් පර්චස් 10 ක ප්‍රමාණයක් බාහිර පාර්ශවයක් විසින් අනවසරයෙන් අත්පත් කරගෙන තිබුණි. | අනවසර භුක්තිය සභාවට ලබා ගත යුතුවේ. | අනවසර භුක්තිය සභාවට ලබා ගැනිමට කටයුතු කරමින් පවති. |
| (ඇ) | 1994 වර්ෂයේදී සොරණවත්ත වෙන්දේසි ඉඩමෙන් පොදු පහසුකම් සඳහා සභාවට වෙන් කර ඇති රූඩ් 02 පර්චස් 06 ක ඉඩමෙන් කොටසක් යාබඳ ඉඩම් හිමියා විසින් අනවසරයෙන් අල්ලාගෙන තිබුණි. | අනවසර භුක්තිය සභාවට ලබා ගත යුතුවේ. | අනවසර භුක්තිය සභාවට ලබා ගැනිමට කටයුතු කරමින් පවති. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නගර සභාව පරිහරණය කරන හොරණ පුස්තකාල ගොඩනැගිල්ල පිහිටි ඉඩම, හොරණ පරණ නගර සභා ගොඩනැගිල්ල හා ඉඩම, මහජන ක්‍රිඩාංගනය , ළමා ක්‍රිඩාංගනය, ළමා ක්‍රිඩාංගනය අසල පෙර පාසැල හා ගිනි නිවීමේ ඒකකය පිහිටි ඉඩම සඳහා හිමිකම් ඔප්පු නොතිබුණි. | හිමිකම් ඔප්පු ලබා ගැනිමට කටයුතු කල යුතුවේ. | පැවරුම් නියෝග ලබා දෙන ලෙස 2018 සැප්තැම්බර් 20 දින ප්‍රා දේශිය ලේකම් වෙත අදාල විස්තර එවා ඇත. |